# පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIAR)

## අයදුම්පත් / නාමයෝජනා සඳහා ආරාධනයයි

# අධ්‍යක්ෂක තනතුර

කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ, පාලනාධිකාරිය / කළමනාකරණ මණ්ඩලය විසින්, 1985 අංක 2 දරන ආඥා පනතේ, අංක 11 හා විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ අංක 07/2020 හා 2020 සැප්තැම්බර් 11 දතම දරන චක්‍රලේඛය හි විධිවිධානවලට අනුකූලව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂක තනතුර සඳහා අයදුම්පත් / නාමයෝජනා කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් / නාමයෝජනා කරනු ලබන්නන්, ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු වන අතර, වයස අවුරුදු 63 ට අඩු විය යුතුය. එසේම 2022 සැප්තැම්බර් මස 02 වන දින සිට බලපවත්වනු ලබන පරිදි වන නව පත්වීමට නායකත්වය සැපයීමට හා කළමනාකරණය සිදු කිරීමට හැකිවන සේ, සුදුසුකම් හා පළපුරුද්ද ද තිබිය යුතුය.

අධ්‍යක්ෂකවරයා ආයතනයේ පූර්ණකාලීන සේවයේ නියුතු නිලධාරියෙකු විය යුතු වන අතර, 1985 අංක 2 දරන ආඥා පනතේ අංක 11 දරන PGIAR (පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ) ආඥාපනත ප්‍රකාරව, ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන ශාස්ත්‍රීය අධ්‍යයන නිලධාරී සහ ප්‍රධාන වගකිය යුතු (ගිණුම්) නිලධාරියාද විය යුතුය.

අයදුම්පත් / නාමයෝජනා සමග පහත සඳහන් ලේඛනද ඉදිරිපත් කළ යුතුය.

I. උපන් දිනය (උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය), සහ විමසුම් විස්තරද ඇතුළත්ව, අයදුම්කරුගේ / නාමයෝජනා ලාභියාගේ සම්පූර්ණ ජීවදත්ත තොරතුරු ප්‍රකාශයක් (ආධාරක ලිපිලේඛනද සමග) ඉදිරිපත් කළ යුතුය.

II. ආයතනයේ සංවර්ධනය පිළිබඳ දැක්මෙ පෞද්ගලික ප්‍රකාශයක්

III. අධ්‍යක්ෂක තනතුරට පත්කරනු ලැබුවහොත්, අයදුම්කරු / නාමයෝජිතයා සාක්ෂාත් කරගැනීමට යෝජනා කරනු ලබන කර්තව්‍යයන්හි ලුහුඬු විස්තරයක්.

IV. නාමයෝජනා පිළිගනු ලැබුවහොත් එය භාරගැනීමට නාමයෝජිතයාගේ කැමැත්ත දක්වන ලිපියක්.

V. අයදුම්කරු / නාමයෝජිතයා, රාජ්‍ය අංශයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ උසස් අධ්‍යාපනික ආයතනයක, (පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය හැර) දැනට සේවය කරමින් සිටින්නේ නම්, ඔහු / ඇය තනතුරට පත්කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් අයදුම්කරු / නාමයෝජිතයා මුදා හැරිය හැකිද යන වග සඳහන් කරමින් සේවායෝජකයා විසින් නිකුත් කරනු ලැබූ ලිපියක්.

තෝරාගැනීමේ ක්‍රියාවලිය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) හි, 2020 සැප්තැම්බර් 11 දතම හා අංක 2020/07 දරන චක්‍රලේඛය හි දී ඇති උපදෙස්වලට අනුව සිදුකරනු ලැබේ. මෙම චක්‍රලේඛය www.ugc.lk වෙබ් අඩවියේ පහත දැක්වෙන ඇඳිය (LINK) ඔස්සේ බාගත කරගත හැකිය.

www.ugc.lk, the Link :

https://www.ugcac.lk/index.php?option=com_content&view=article&id=2221%Acommission-circular-no-072020-appointment-to-the-post-of-director-of-an-institute-&catid=176%3Acirculars-published-in-2020-012020-and-above&Itemid=20&lang=en

අයදුම්පත් / නාමයෝජනා 2022 මාර්තු මස 23 වන දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර ලැබෙනසේ ලේඛනගත තැපැලෙන්, කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ, අංක 407 හි, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සාමාන්‍ය පරිපාලන අංශයේ, පාලනාධිකාරි (කළමනාකරණ මණ්ඩල) ලේකම් වෙත, මුද්‍රා තබන ලද කවරයක / ලිපි කවරයක බහා, එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "අධ්‍යක්ෂක තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සටහන්කර ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්හට / නාම යෝජිතයන්හට උපදෙස් දෙනු ලැබේ.

ඉහත උපදෙස්වලට අනුකූල නොවන සහ නියමිත අවසාන දිනෙන් පසුව ලැබෙන ප්‍රමාද අයදුම්පත් / නාමයෝජනා භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**කළමණාකරන මණ්ඩලයේ / පාලනාධිකාරීයේ ලේකම්,**
**සාමාන්‍ය පරිපාන අංශය,**
**පුරා වීද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 407, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**
**2022-03-09**